# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
## තාක්ෂණ අධ්‍යාපන ශාඛාව
අ.පො.ස.(උසස් පෙළ) උපකාරක තක්සේරුව - **2026**

| ගෘහ ආර්ථික විද්‍යාව | 28 | S | 1 | කාලය පැය 2 |
|---|---|---|---|---|

**උපදෙස්**
- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1) (2) (3) (4) (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (x) යොදා දක්වන්න.**

1. පරිසරයේ පවතින සියලු වර්ණ සෑදීම සඳහා පහත කාණ්ඩ අතුරෙන් අත්‍යවශ්‍ය වර්ණ කාණ්ඩය වන්නේ,
   1. නිල්, රතු සහ තැඹිලි ය.
   2. කහ, රතු සහ නිල් ය.
   3. දම්, නිල් සහ කොළ ය.
   4. තැඹිලි, කොළ සහ දම් ය.
   5. කොළ, කහ සහ නිල් ය.

2. ශ්‍රී ලංකාවේ විහාර සිතුවම් කලාවේ සුන්දර නිර්මාණයක් පහත දැක්වේ. මෙහි නිර්මාණකරුවා වන්නේ,



   1. ජෝර්ජ් කීට් මහතා ය.
   2. ජෙෆ්රි බාවා මහතා ය.
   3. මහගම සේකර මහතා ය.
   4. සොයිලියස් මෙන්ඩිස් මහතා ය.
   5. ලයනල් වෙන්ඩ්ට් මහතා ය.

3. තැන්පත්බව, නිශ්චලබව සහ චලනය, ලාලිත්‍යය යන හැඟීම් පිළිබිඹු කරන රේඛා පිළිවෙලින් නම් කරන්න.
   1. සිරස් රේඛා සහ තිරස් රේඛා
   2. අක්වක් රේඛා සහ වක්‍ර රේඛා
   3. වක්‍ර රේඛා සහ විකර්ණාකාර රේඛා
   4. අක්වක් රේඛා සහ සිරස් රේඛා
   5. තිරස් රේඛා සහ අක්වක් රේඛා.

4. පහත සඳහන් වැකි අතුරෙන් **නිරවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
   1. විසිත්ත කාමරයේ පොළොව සඳහා සුදු පැහැති ටයිල් යෙදීමෙන් අවකාශයෙහි ප්‍රමාණය විශාල කොට දැක්විය හැකි වේ.
   2. නිවසක උතුර සහ බස්නාහිර දිශාවන් සඳහා ඝනකම අඩු බිත්ති යොදාගත හැකි වේ.
   3. ගෙවත්ත අලංකරණයේ දී ඉඩම පිහිටි ප්‍රදේශයට ආවේණික ශාක සිටුවීමෙන් ඉඩමේ වටිනාකම වැඩි වේ.
   4. පුනර්ජනනීය ශක්ති ප්‍රභේදයක් ලෙස ජල විදුලිය සහ ගල් අඟුරු නම් කළ හැකි වේ.
   5. නිවස තුළට ඍජු හිරු එළිය ලැබීමට සැලැස්වීමෙන් නිවස අභ්‍යන්තර පරිසරයේ තාපය පාලනය කළ හැකි වේ.

5. බහුලව හමුවන පොලිසැකරයිඩ වර්ග **දෙකක්** වන්නේ,
   1. පිෂ්ටය සහ ග්ලූකෝස් ය.
   2. ගැලැක්ටෝස් සහ සෙලියුලෝස් ය.
   3. සෙලියුලෝස් සහ ග්ලයිකොජන් ය.
   4. මෝල්ටෝස් සහ ග්ලයිකොජන් ය.
   5. පිෂ්ටය සහ මෝල්ටෝස් ය.

6. විටමින් **$B_5$** හි රසායනික නාමය වනුයේ,
   1. ඇඩිනීන් ය.
   2. පැන්ටතොනික් අම්ලය ය.
   3. ඇඩිනොසින් ය.
   4. ඇස්කෝබික් අම්ලය ය.
   5. නියසින් ය.

7. ස්නායු ආවේග සම්ප්‍රේෂණය වන ස්නායු සෛල සෑදී ඇත්තේ,
   1. යකඩවලිනි.
   2. පොස්පරස්වලිනි.
   3. කැල්සියම්වලිනි.
   4. ලිපිඩවලිනි.
   5. කාබෝහයිඩ්‍රේට්වලිනි.

8. පෝෂණය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
   A. සත්ත්ව ආහාරවල අඩංගු විටමින් A රෙටිනෝල් නමින් හැඳින්වේ.
   B. විටමින් A සහ C ජලද්‍රාවී විටමින් වේ.
   C. බාර්ලි, තිරිඟු සහ ඕට්ස්වල මෝල්ටෝස් අඩංගු වේ.
   D. සහල්වල ලයිසීන් අඩංගු වේ.
   මේවායින් නිවැරදි ප්‍රකාශ වන්නේ,
   1. A සහ B ය.
   2. A සහ C ය.
   3. B සහ D ය.
   4. C සහ D ය.
   5. A, B සහ D ය.

9. කැල්සියම් සහ මැග්නීසියම් අවශෝෂණය හොඳින් සිදුවීමට ආහාරයේ තිබිය යුතු විටමිනය වන්නේ,
   1. විටමින් A ය.
   2. විටමින් B ය.
   3. විටමින් C ය.
   4. විටමින් D ය.
   5. විටමින් E ය.

10. ප්‍රෝටීන් ජීර්ණයේ දී උපකාරී වන එන්සයිම දෙකක් වන්නේ,
   1. ට්‍රිප්සීන් සහ ඇමයිලේස් ය.
   2. පෙප්ටිඩේස් සහ සුක්‍රේස් ය.
   3. පෙප්සීන් සහ ට්‍රිප්සීන් ය.
   4. පෙප්සීන් සහ ලැක්ටේස් ය.
   5. ඇමයිලේස් සහ සුක්‍රේස් ය.

11. ආහාර වේලකින් ලැබුණු මුළු ශක්ති ප්‍රමාණය කිලෝකැලරි 930 කි. එහි ප්‍රෝටීන් ග්‍රෑම් 60ක් ද, මේද ග්‍රෑම් 30ක් ද, අඩංගු ය. මෙම ආහාර වේලෙහි අඩංගු ආසන්න කාබෝහයිඩ්‍රේට් ග්‍රෑම් ප්‍රමාණය වනුයේ,
   1. ග්‍රෑම් 45 කි.
   2. ග්‍රෑම් 50 කි.
   3. ග්‍රෑම් 75 කි.
   4. ග්‍රෑම් 100 කි.
   5. ග්‍රෑම් 120 කි.

12. ආහාර ජීරණ පද්ධතිය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

   A.ආමාශයේ අවිදූර කෙළවර අන්නස්‍රෝතය සමඟ ද විදූර කෙළවර ග්‍රහණිය සමඟ ද සම්බන්ධ ය.
   B. අන්නස්‍රෝතය ආමාශයට විවෘත වන ස්ථානයේ ආලාර වක්‍ර පිධානය පිහිටා ඇත.
   C. ක්ෂුද්‍රාන්තයේ අංගුලිකා පිහිටා ඇති අතර ඒවායින් ජීරණය වූ ආහාර අවශෝෂණය කරයි.
   D. මහාන්ත්‍රයේ දී ජලය හා ඛනිජ අවශෝෂණය කරයි.

   ඉහත ප්‍රකාශ අතරින් **නිවැරදි** ප්‍රකාශය වනුයේ,

   1. A, B සහ C ය.
   2. A, B සහ D ය.
   3. A, C සහ D ය.
   4. B, C සහ D ය.
   5. A, B, C සහ D ය.

13. ජීර්ණ පද්ධතියේ කොටස් (අ) තුළින් ද සිදුවන කාර්යයන් කිහිපයක් (ආ) තුළින් ද දැක්වේ.

| (අ) | (ආ) |
|---|---|
| • අක්මාව | A. බැක්ටීරියා මගින් විටමින් K හා බයෝටීන් නිපදවයි. |
| • පිත්තාශය | B. පැය 1-2 ට පසු ආහාරය ඝන දියරයක් බවට පත්වේ. |
| • ආමාශය | C. පිත නිෂ්පාදනය කරයි. |
| • මහා අන්ත්‍රය | D. ගබඩා කරගත් පිත, අවශ්‍ය ප්‍රමාණයට ආහාර මාර්ග පද්ධතියට නිදහස් කරයි. |

ඒ අනුව ජීර්ණ පද්ධතියේ කොටස්, එහි කාර්යයන් සමග නිවැරදිව ගලපා ඇති අනුපිළිවෙළ වන්නේ,

1. A, B, C සහ D ලෙස ය.
2. A, D, C සහ B ලෙස ය.
3. C, D, A සහ B ලෙස ය.
4. C, D, B සහ A ලෙස ය.
5. D, C, A සහ B ලෙස ය.

14. මිනිස් සිරුර ආශ්‍රිත ඛනිජ ඌනතා ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
   • කායික සහ මානසික උදාසීනත්වය ඇති වීම
   • ඉක්මනින් වෙහෙසට පත්වීම
   • ශරීර වර්ධනය අඩාල වීම

   ඉහත ඌනතා ලක්ෂණ ඇති වීමට බලපාන ඛනිජය කුමක්ද?

1. යකඩ
2. කැල්සියම්
3. සින්ක්
4. පොස්පරස්
5. අයඩීන්

15. පෝෂණ මූලාශ්‍ර පිළිබඳව පහත ප්‍රකාශ අතරින් **සාවද්‍ය ප්‍රකාශය** කුමක්ද?

1. ශ්‍රී ලාංකිකයන් සඳහා නිර්දේශිත දෛනික පෝෂණ අවශ්‍යතා සටහනක් (RDA) ශ්‍රී ලංකා වෛද්‍ය පර්යේෂණ ආයතනය මගින් සකස් කර ඇත.
2. සාමාන්‍ය නීරෝගී පුද්ගලයෙකු විසින් ආහාර කාණ්ඩවලින් එක් වේලකට ගත යුතු ප්‍රමාණය ආහාර පිරමීඩයෙන් දක්වා ඇත.
3. විවිධ ආහාර කාණ්ඩවලට අයත් ද්‍රව්‍යවල පෝෂණමය අගය පෝෂණ වගුවේ දක්වා ඇත.
4. පුද්ගලයකු තම එක් දිනක ආහාර සලාකයෙන් සුදුසු පරිදි ප්‍රධාන ආහාර වේලකට ගන්නා ප්‍රමාණය ආහාර පංගුවයි.
5. නිර්දේශිත දෛනික පෝෂණ අවශ්‍යතා සටහනේ අවශ්‍ය ප්‍රෝටීන් ප්‍රමාණය දක්වා ඇත්තේ ග්‍රෑම්වලිනි.

16. පෝෂණ ගැටලු සහ දුෂ්පෝෂණය වැළැක්වීම සඳහා සම්බන්ධ වන රාජ්‍ය **නොවන** සංවිධානයක් වනුයේ,

1. පවුල් සෞඛ්‍ය කාර්යාංශය ය.
2. ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනය ය.
3. වෛද්‍ය පර්යේෂණ ආයතනය ය.
4. ආහාර පාලන පරිපාලන ඒකකය ය.
5. ලෝක ආහාර වැඩසටහන ය.

17. බිත්තරයක් පෝච් කිරීමේ දී යොදා ගන්නා තාප සංක්‍රාමණ ක්‍රමය/ක්‍රම වනුයේ,

1. සංවහනය ය.
2. සන්නයනය ය.
3. සංවහනය සහ සන්නයනය ය.
4. සංවහනය සහ විකිරණය ය.
5. සංවහනය, සන්නයනය සහ විකිරණය ය.

18. කිරි ආශ්‍රිත නිෂ්පාදන සහ බේකරි නිෂ්පාදන සඳහා භාවිත කරන රසායනික සංයෝග පිළිවෙළින් දක්වා ඇත්තේ,

1. ප්‍රොපියොනේට් සහ සෝබේට් ය.
2. ඇමීන සහ බයිෆීනයිල් ය.
3. බෙන්සොඒට් සහ පැරාබෙන්සොඒට් ය.
4. ඇමීන සහ සෝබේට් ය.
5. සෝබේට් සහ ප්‍රොපියොනේට් ය.

19. ආහාර නරක් වීම කෙරෙහි ආහාර තුළ සිදුවන ජෛව රසායනික ක්‍රියා සම්බන්ධ **නිරවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
   1. ආහාරවල අඩංගු සීනි හා නිදහස් ඇමයිනෝ අම්ල, එන්සයිමීය දුඹුරු පැහැ ගැන්වීමට හේතු වේ.
   2. ආහාර මුඩුවීමේ දී, එහි අඩංගු මේද අම්ල හා ග්ලිසරෝල් සංයෝග වී ඔක්සිකරණය සිදුවේ.
   3. ආහාර වියළි තාපයට භාජනය වීමෙන් එහි අඩංගු ඔක්සිහාරක සීනි සහ නිදහස් ඇමයිනෝ අම්ල කාණ්ඩ, තාපයට ලක්වීම එන්සයිමීය නොවන දුඹුරු පැහැවීම සිදුවේ.
   4. ආහාරවල සිදුවන පැසවීමේ ක්‍රියාවලිය සඳහා ඇතැම් දිලීර විශේෂ පමණක් හේතු වේ.
   5. කැරමලීකරණයේ දී ආහාරයේ වර්ණ විපර්යාසය සඳහා ජල අණු සංයෝජනය වී දුඹුරු පැහැ වේ.

20. පලතුරු වර්ගයක් පරිරක්ෂණය කිරීමේ දී යොදාගත් පියවර කිහිපයක් පහත දැක්වේ.
   • ක්ලෝරිනීකෘත ජලයෙන් සේදීම.
   • සිට්‍රික් අම්ල ද්‍රාවණයක බහා තැබීම.
   • සුබ්‍රීකරණය (Blanching) කිරීම.

   ඉහත පියවර මගින් ආහාර පරිරක්ෂණයට ඉවහල් වන මූලධර්ම පිළිවෙලින් ඇතුළත් කාණ්ඩය කුමක්ද?
   1. කෘමි හානි වැළැක්වීම, එන්සයිම අක්‍රිය කිරීම සහ රසායනයක ප්‍රතික්‍රියා වැළැක්වීම.
   2. ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය නිශේධනය කිරීම, රසායනික ප්‍රතික්‍රියා නිශේධනය සහ එන්සයිම අක්‍රිය කිරීම.
   3. භෞතික හානි අවම කිරීම, ක්ෂුද්‍ර ජීවී ක්‍රියා නිශේධනය සහ රසායනික ප්‍රතික්‍රියා නිශේධනය කිරීම.
   4. එන්සයිම අක්‍රිය කිරීම, කෘමි හානි අවම කිරීම හා ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරකම් නිශේධනය කිරීම.
   5. රසායනික ප්‍රතික්‍රියා නිශේධනය කිරීම, කෘමි හානි අවම කිරීම සහ එන්සයිම අක්‍රිය කිරීම.

21. ආහාරයේ ප්‍රමාණය වැඩිකර පෙන්වන කාරකයක් වන්නේ,

| | | |
|---|---|---|
| 1. ජෙලටින් ය. | 3. ලෙසිතීන් ය. | 5. පෙක්ටින් ය. |
| 2. ඒගාර් ය. | 4. ඉරිඟු පිටි ය. | |

22. විශේෂිත තත්ත්ව යටතේ ආහාර ඇසුරුම් කිරීමේ දී යොදා ගන්නා ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක්වේ.
   A. ආහාර ද්‍රව්‍ය හා ඇසුරුම අදාළ උෂ්ණත්වය යටතේ ජීවානුහරණය කිරීම.
   B. ආහාර ඇසුරුම් කිරීමේදී අභ්‍යන්තරයේ වායු මිශ්‍රණය පරීක්ෂා කර වායු මිශ්‍රණයේ සංයුතිය ප්‍රශස්ත අගයක පවත්වා ගැනීම.
   C. ආහාරයෙන් තෙතමනය ඉවත් නොවන ලෙස සහ ශීත දැවීමට ලක් නොවන ලෙස තැබීම.
   D. ඇපල්, මස් වර්ග සහ අර්තාපල් වැනි ආහාරවල ජීව කාලය දීර්ඝ කාලයක් පවත්වා ගැනීමට යොදා ගැනීම.

   මින් **පාලිත තත්ත්වය** යටතේ ආහාර ඇසිරීමට අදාළ ක්‍රියාමාර්ග වනුයේ,

| | | |
|---|---|---|
| 1. A සහ B ය. | 3. B සහ C ය. | 5. C සහ D ය. |
| 2. A සහ C ය. | 4. B සහ D ය. | |

23. රෙදිපිළි නිෂ්පාදනය සඳහා භාවිත වන කෙඳි පිළිබඳ **නිරවද්‍ය** ප්‍රකාශය මින් කුමක්ද?
   1. සීසල්, ප්‍රෝටීන් පදනමක් සහිතව නිෂ්පාදිත කෙඳි විශේෂයක් වේ.
   2. ඇස්බැස්ටෝස්, වීදුරු සහ රන් ඛනිජමය කෙඳි වර්ග වේ.
   3. පෙනා කෙඳි, අන්නාසි පත්‍රවලින් ලබා ගන්නා කෙඳි වේ.
   4. ෆ්ලැක්ස් ශාකයෙහි පත්‍ර, ලිනන් කෙඳි ලබා ගැනීම සඳහා භාවිත වේ.
   5. ඇරමිඩ්, කෘත්‍රිම පොලිමර් කාණ්ඩයට අයත් කෙඳි විශේෂයක් වේ.

24. රෙදිපිළි සේදීමේ දී හැකිලීම වැළැක්වීම සඳහා සිදුකරන ප්‍රතිකාරකයක් වන්නේ,

| | | |
|---|---|---|
| 1. විරංජනය ය. | 3. මලහරණය ය. | 5. මසරීකරණය ය. |
| 2. සැන්ෆරීකරණය ය. | 4. ෆෙල්ට් කිරීම ය. | |

25. මෙම රූප සටහනේ දැක්වෙන්නේ, කෙඳි විශේෂයක හරස්කඩ ව්‍යුහයයි. මෙම කෙඳි විශේෂය වන්නේ,



1. කපු ය.
2. සේද ය.
3. ලිනන් ය.
4. පොලියෙස්ටර් ය.
5. රෙයෝන් ය.

26. විෂ්කම්භය 16 cm වන වෘත්තාකාර මේස දරණුවක් මැසීමේ දී පැඩින් කපා ගත යුතු විෂ්කම්භය වන්නේ,

1. 15 cm කි. 2. 16 cm කි. 3. 17 cm කි. 4. 18 cm කි. 5. 19 cm කි.

27. විශේෂිත ඇඳුම් සඳහා සියුම් ක්‍රියාශීලි කාබන් තරලයක් භාවිත කරනු ලබන්නේ,

1. වෙඩි නොවදින නිමාවට ය.
2. ගිනිරෝධක නිමාවට ය.
3. න්‍යෂ්ටික විකිරණවලට ඔරොත්තු දෙන නිමාවට ය.
4. රසායනික ද්‍රව්‍යවලට ඔරොත්තු දෙන නිමාවට ය.
5. සුව පහසු නිමාවට ය.

28. කෙටි සාය පතරොම නිර්මාණය කිරීමට රාමුව ඇඳීමේදී, උකුල මිනුම ගණනය කරනුයේ,

1. උකුල වට මිනුම ÷ 2 + 1.5 cm ලෙස ය.
2. උකුල වට මිනුම ÷ 4 + 1.5 cm ලෙස ය.
3. උකුල වට මිනුම ÷ 4 + 2 cm ලෙස ය.
4. උකුල වට මිනුම ÷ 2 + 2 cm ලෙස ය.
5. උකුල වට මිනුම ÷ 2 + 2.5 cm ලෙස ය.

29. නිමි ඇඳුම් කර්මාන්තයේ භාවිත වන මැහුම් ක්‍රමයක් වන **අත්මැස්ම** 201 (Hand Stitch – Type - 201) යොදාගනු ලබන්නේ,

1. ක්‍රීඩා ඇඳුම්වල අද්දර නිම කිරීම සඳහා ය.
2. තාවකාලික මැහුම් ක්‍රම සඳහා ය.
3. බොත්තම් ඇල්ලීම සඳහා ය.
4. රෙදි දෙපොටක් සම්බන්ධ කිරීම සඳහා ය.
5. ලේස්, ඉලාස්ටික් ඇල්ලීම සඳහා ය.

30. මැසීමේ ශිල්පීය ක්‍රම දෙකක් වන්නේ,

1. වාටි මැස්ම සහ බඳන යෙදීම ය.
2. වාටි මැස්ම සහ රේන්ද ඇල්ලීම ය.
3. රේන්ද ඇල්ලීම සහ බඳන යෙදීම ය.
4. සිහින් නූල් දුවවීම සහ වාටි මැස්ම ය.
5. බඳන යෙදීම සහ සිහින් නූල් දුවවීම ය.

31. පහත සඳහන් ප්‍රකාශ අතුරින් **අච්චු මුද්‍රණයට** අදාළ ප්‍රකාශ ඇතුළත් වරණය වන්නේ,

A. ලී භාවිතයෙන් අච්චු සකස් කර ගනියි.

B. ඝන X කිරණ කොළ ආධාරයෙන් මෝස්තර සකසා ගනියි.

C. සායම් ආලේප කිරීමට රෝලරයක් උපයෝගී කර ගනියි.

D. මෝස්තරය මත ලැකර් ආලේප කර ශක්තිමත් කර ගනියි.

1. A සහ B ය.
2. A සහ C ය.
3. B සහ C ය.
4. B සහ D ය.
5. C සහ D ය.

32. මනා සන්නිවේදනයට ඇති බාධා මග හරවා ගැනීමට අවශ්‍ය කරුණක් වනුයේ,
   1. භාෂා දැනුම හා භාෂාව හැසිරවීම පිළිබඳ ඇති අවබෝධය තිබීම ය.
   2. නවීන තාක්ෂණය පිළිබඳ ඇති අනවබෝධය හා අකැමැත්ත ය.
   3. පුද්ගල සම්බන්ධතාවලට ඇති කැමැත්ත අවම වීම ය.
   4. නිවැරදි තොරතුරු ග්‍රහණය කර ගැනීමේ අපහසුතාවය ය.
   5. සන්නිවේදන ක්‍රියාවලියේ දී අවධානය යොමු නොකිරීම ය.

33. ප්‍රතිමෝදක ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.
   A. ගෙවතු වගාවෙහි නිරත වීම.
   B. ප්‍රිය සම්භාෂණවලට සහභාගී වීම.
   C. විනෝදය සඳහා රිය පැදවීම.
   D. ස්වයං නිර්මාණවල නිරත වීම.

මින් ගෘහ ආශ්‍රිත සන්තුෂ්ටිය සඳහා අදාළ ක්‍රියාකාරකම් වන්නේ,

1. A සහ B ය.    2. A සහ D ය.    3. B සහ C ය.    4. B සහ D ය.    5. C සහ D ය.

34. සංචරණ ප්‍රභේදවලට අයත් **නොවන්නේ**,
   1. ස්වභාව ධර්ම සංචරණය ය.
   2. සංස්කෘතික සංචරණය ය.
   3. සෞඛ්‍ය සංචරණය ය.
   4. සත්ත්ව සංචරණය ය.
   5. අජටාකාශ සංචරණය ය.

35. සංචරණයේ පාරිසරික ධනාත්මක බලපෑමක් වන්නේ,
   1. පුරාවිද්‍යාත්මක ස්ථාන සහ පෞරාණික ස්ථාන අධිභාවිතය හෝ අවභාවිතය ය.
   2. පරිසරයට ඔරොත්තු දෙන ධාරිතාව පිළිබඳ ගැටළු ය.
   3. පරිසර පද්ධති විනාශය ය.
   4. පරිසරාත්මකව දුර්වල පරිසර පද්ධති පැවතීම ය.
   5. පරිසර සුරක්ෂිත කිරීම හා සංරක්ෂණය වීම ය.

36. ජාත්‍යන්තර සංචරණය තුළ සුවිශේෂ සංචරණ ප්‍රවාහයක් වන්නේ,
   1. කලාප අභ්‍යන්තර සංචරණය ය.
   2. අභ්‍යන්තර සංචරණය ය.
   3. විකල්ප සංචරණය ය.
   4. ජාතික සංචරණය ය.
   5. සංස්කෘතික සංචරණය ය.

37. ජල නළ එළීමේ දී විශ්කම්භය අසමාන නළ දෙකක් සම්බන්ධ කිරීම සඳහා යොදා ගන්නා කෙවෙනි වර්ගය වන්නේ,
   1. T කෙවෙනි (T Socket) ය.
   2. කරාම කෙවෙනි (Faucet Socket) ය.
   3. කපාට කෙවෙනි (Valve Socket) ය.
   4. වැලමිට කෙවෙනි (Elbow Socket) ය.
   5. ඌනන කෙවෙනි (Reducing Socket) ය

38. වොට් 1000 (1000 W) විදුලි ඉස්ත්‍රික්කයක් පැයක් ක්‍රියාත්මක කළ විට වැය වන විද්‍යුත් ශක්ති ප්‍රමාණය විදුලි ඒකක ගණන වන්නේ,

1. 0.5 කි.    2. 1 කි.    3. 1.5 කි.    4. 10 කි.    5. 100 කි.

39. නිවැරදි වරණය තෝරන්න.
   1. සන්නායකයකින් විදුලි ධාරාවක් පිටතට කාන්දු වීම වැළැක්වීමට පරිවාරක භාවිත කරයි.
   2. භූගත රැහැන හා උදාසීන රැහැන ශේෂ ධාරා පරිපථ බිඳනයට සම්බන්ධ කොට තිබේ.
   3. විද්‍යුත් උපකරණයකින් වැය කරන විද්‍යුත් ශක්ති ප්‍රමාණය ඇම්පියර්වලින් (A) ගණනය කරනු ලබයි.
   4. සන්නායකයක් තුළින් විදුලි ධාරාවක් ගලායාමට දක්වන බාධාව වෝල්ටීයතාව (V) ලෙස හඳුන්වයි.
   5. විදුලි සැපයුමක එක් අග්‍රයකට සාපේක්ෂව අනෙක් අග්‍රයේ විභව වෙනස වොට් (W) ලෙස හඳුන්වයි.

40. පහන් පරිපථවල සෑම බල්බයක් ම දැල්වීමට හා නිවීමට ස්විචය හා සම්බන්ධ වන රැහැන වන්නේ,
1. සජීවී රැහැන ය.
2. උදාසීන රැහැන ය.
3. සජීවී හා උදාසීන යන රැහැන් දෙකම ය.
4. භූගත රැහැන ය.
5. සජීවී හා භූගත රැහැන ය.

41. ආලෝකය ලබා ගැනීම සඳහා භාවිත කරන විදුලි පහන් අතරින් වඩාත් කාර්යක්ෂම පහන් වර්ගය වන්නේ,
1. සූත්‍රිකා පහන් ය.
2. ප්‍රතිදීප්ත පහන් ය.
3. සුසංහිත ප්‍රතිදීප්ත පහන් ය.
4. ආලෝක විමෝචක පහන් ය.
5. හැලජන් පහන් ය.

42. පහත ප්‍රකාශ පිළිබඳව සලකා බලන්න.
A. සකස් කළ මස්, ටින් මාළු හා ආනයනය කරන ලද සහල් භාවිතය.
B. ආහාර මිල දී ගැනීම සඳහා වෙළඳ පොළට යාමට පෞද්ගලික වාහන භාවිතය.
C. තම නිවසේ කාබනික ගොවිතැනෙන් ලැබෙන අස්වැන්න පවුලේ පරිභෝජනයට යොදා ගැනීම.
D. තම නිවසට ආසන්න ගොවිපොළෙන් එළවළු මිල දී ගැනීම.

ඉහත ක්‍රියාමාර්ග අතරින් ආහාර පා සලකුණු (Food Foot Print) අවම කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග වන්නේ,
1. A සහ B ය.
2. A සහ C ය.
3. B සහ C ය.
4. B සහ D ය.
5. C සහ D ය.

43. ගෘහස්ථව ආහාර පිසීමේ දී, පරිසරයට මුදා හරින වායු විමෝචක අවම කර ගැනීම සඳහා වඩාත් ම සුදුසු ක්‍රියා මාර්ගය වන්නේ,
1. විවෘත භාජනවල ආහාර පිසීම ය.
2. පීඩන උදුනට අවශ්‍ය ප්‍රමාණයට ජලය යොදා භාවිත කිරීම ය.
3. මැටි භාජන භාවිත කිරීමේදී දර ලිපේ ගින්දර වැඩි කිරීම ය.
4. විශාල භාජනවල ආහාර පිසීම ය.
5. ගෑස් උදුන්වල ආහාර පිසීමේදී මැටි භාජන භාවිත කිරීම ය.

44. පාංශු වසුන් ලෙස භාවිත කරන ඖෂධීය ශාක දෙකකි.
1. මුකුණුවැන්න සහ ගොටුකොළ
2. තිප්පිලි සහ උඳුපියලිය
3. හාතවාරිය සහ උඳුපියලිය
4. ගම්මාළු සහ ගොටුකොළ
5. හීන් අරත්ත සහ මොණරකුඩුම්බිය

45. පහත සඳහන් ලක්ෂණ, යොවුන් වියේ දරුවන්ගේ දක්නට ලැබේ.
A. සම පැහැපත් වීම.
B. කටහඬ වෙනස් වීම.
C. කිහිලි හා ලිංග ආශ්‍රිත රෝම වැවීම.
D. ස්ත්‍රී ජන්මාණු සෛල නිපදවීම.

මෙයින් යොවුන් වියේ ගැහැණු දරුවකු පෙන්වන ද්විතීයික ලිංගික ලක්ෂණ **පමණක්** අයත් පිළිතුර වන්නේ,
1. A පමණි.
2. B පමණි.
3. C පමණි.
4. A සහ D පමණි.
5. C සහ D පමණි.

46. නව යොවුන්වියට අදාළ වයස් සීමාවන් පිළිබඳ මනෝ විද්‍යාඥයින් විවිධ මත පළ කර ඇත. ඒ අතරින් **ගෙසල්** දක්වන වයස් සීමාව වන්නේ,
1. වයස අවුරුදු 10-16 අතර ය.
2. වයස අවුරුදු 10-19 අතර ය.
3. වයස අවුරුදු 11-20 අතර ය.
4. වයස අවුරුදු 12-18 අතර ය.
5. වයස අවුරුදු 13-18 අතර ය.

47. යෞවනයෙකුට තම පෞරුෂය වර්ධනය කර ගැනීම සඳහා කළ හැකි ක්‍රියාකාරකමක් **නොවන්නේ,**

1. මවගේ සහ පියාගේ දෛනික කටයුතුවලට සහාය දැක්වීම ය.
2. දෛනික කාර්ය සටහනක් සකස් කර ඒ අනුව කටයුතු කිරීම ය.
3. ක්‍රීඩා හා සෞන්දර්ය කටයුතුවලට සහභාගි වීම ය.
4. තමා සතු වගකීම අන් අයට පැවරීම ය.
5. නායකත්වය දැරීම ය.

48. දරුවෙකුගේ මානසික නිරෝගි බවට හේතුවෙන ජානමය සාධකයක් **නොවන්නේ,**

1. කායික ලක්ෂණ ය.
2. බිඳ වැටුණු අධ්‍යාපනික පරිසරය ය.
3. බුද්ධිමය හැකියාවන් ය.
4. සුවිශේෂී හැකියාවන් ය.
5. පරම්පරාගත ඇතැම් ලෙඩ රෝග ය.

49. සාර්ථක ව්‍යාපාරිකයෙක් පහත ලක්ෂණවලින් යුක්ත ය.

A. සර්ව සුබවාදී වීම.
B. අවදානම් භාර ගැනීමට ඇති අකැමැත්ත.
C. වෙනස්වීමට ඇති කැමැත්ත.

මේ අතරින් ව්‍යවසායකයෙක් සතුවිය යුතු ලක්ෂණය/ලක්ෂණ වන්නේ,

1. A පමණි.
2. B පමණි.
3. C පමණි.
4. A සහ C පමණි.
5. B සහ C පමණි.

50. ව්‍යාපාරයක් පවත්වා ගෙන යාමේ දී අනුගමනය කරන බාහිර ආචාර ධර්මයක් **නොවන්නේ,**

1. පාරිභෝගික අවශ්‍යතා ඉටු කිරීම ය.
2. සාධාරණ මිල ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම ය.
3. ව්‍යාපාරික නීති අනුගමනය කිරීම ය.
4. අලෙවිකරණය ය.
5. ගුණාත්මක පාලනය ය.